සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

52 | S | I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 -2020**

විභාග අංකය .................................. නර්තනය (දේශීය) I කාලය පැය දෙකයි

වැදගත්

අංක 01 සිට 25 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහනෙහි යොදන්න.

◈ **උපදෙස් : මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 100 කි.**

01. 'කිරිමඩුව ශාන්තිකර්මය හා සබරගමු නර්තන කලාව' ග්‍රන්ථ රචනා කරන ලද්දේ,
1. තිස්ස කාරියවසම් මහතා හා ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය විසිනි.
2. මුදියන්සේ දිසානායක හා ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය විසිනි.
3. ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය හා ලයනල් බෙන්තරගේ මහතා විසිනි.
4. ලයනල් බෙන්තරගේ මහතා හා ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය විසිනි.
5. ජයසේන කෝට්ටෙගොඩ මහතා හා ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය විසිනි. (.....)

02. 'තාත් ජිංත කුද ජිංග කුං තරිකිට කුද ගජිං' මෙම අවඩි කොටස ඇතුළත් නර්තන අංගයකි.
1. බුල්ත පදය
2. ආවැන්දුම
3. කොතල පදය
4. කුවේණි අස්න
5. යක්කැන්දුම (.....)

03. මුසලඩි හා ගණපති වන්නම් වලට අදාල තාල රූප වනුයේ,
1. මැදුම් මහ දෙතිත හා මැදුම් තනිතිත
2. මැදුම් තනිතිත හා සුළු මහ දෙතිත
3. මැදුම් මහ දෙතිත හා සුළු මහ දෙතිත
4. මහතනි තිත හා මැදුම් තනිතිත
5. සුළු මැදුම් දෙතිත හා මැදුම් තනිතිත (.....)

04. නුගේ හැල්ල සහ ගවරමල යන සුවිශේෂ අවස්ථා භාවිතා වන ශාන්තිකර්ම වනුයේ,
1. කොහොඹායක් කංකාරිය සහ රටයකුමය
2. වළියක් මංගල්‍ය සහ රටයකුම ය.
3. වළියක් මංගල්‍ය සහ කොහොඹායක් කංකාරිය ය.
4. කිරිමඩුව සහ වළියක් මංගල්‍ය ය.
5. රටයකුට සහ කිරිමඩුව (.....)

05. උඩරට වෙස් ඇඳුම් කට්ටලයේ ශිඛාබන්ධනය සහ අවුල්හැරය පළඳින ස්ථාන පිළිවෙලවන්නේ,
1. හිස සහ උරහිසය.
2. හිස හා මැණික්කටුව ය.
3. හිස සහ පපුවටය.
4. පපුව සහ හිස ය.
5. පපුව සහ මැණික්කටුව ය. (.....)

06. කොහොඹා හැල්ල නර්තන අංගයට අයත් කවි පාදය වනුයේ,
1. සියොපත් පතිනේ දිගුනුව නෙතිනේ...
2. ඉනේ හවඩි රන් කෙඳිවන්...
3. සිරිවස ගෙන අසු නැගෙමින් නොලසා...
4. වීර මුණ්ඩ දෙවි වඩින්ඩ...
5. අනේ මී මැස්සේ... (.....)

07. අරිච්චෙට්ටු, සුළකු සහ කොළදුපරිතාල් යන ද්‍රවිඩ ගැමි නැටුම් වලට සමාන සිංහල ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,
1. කුලු, ගොයම් හා මෝල්ගස් නැටුම් ය. 2. ගොයම්, කුලු හා මෝල්ගස් නැටුම් ය.
3. මෝල්ගස් කුලු හා ගොයම් නැටුම් ය. 4. ගොයම්, තේදළු හා කළගෙඩි නැටුම් ය.
5. ගොයම්, කුලු හා තේදළු නැටුම් ය. (.....)

08. 'දොං ජිං ගත්තත් ජිංගත දොංතක' මෙම බෙර පදය වාදනය කළ හැකි තාල රූපයට වන්නේ,
1. මහ තනිතිත ය. 2. මැදුම් තනිතිත ය.
3. මැදුම් මහ දෙතිත ය. 4. සුළු මහ දෙතිත ය.
5. දෙසුළු මැදුම් තුන්තිත ය. (.....)

09. ඇත් බන්ධනය, මී බන්ධනය හා ආඬිගුරු නැටීම යන නාට්‍යමය පෙළපාලි අන්තර්ගත ශාන්තිකර්ම වන්නේ,
1. රටයකුමය. 2. සූනියම් යාගයය. 3. කිරිමඩුව ය. 4. වළියක් මංගල්‍ය ය. 5. පහන් මඩුව ය.
(.....)

10. 'තාලස්තල, ප්‍රතිෂ්ඨයමිති, ධානෝර්, සඤ් ස්මෘතඃ යනුවෙන් තාලය පිළිබඳ නිර්වචනය කර ඇත්තේ,
1. අමරසිංහ ආචාර්‍යයන්ගේ 'අමරකෝෂය' ග්‍රන්ථයෙනි.
2. අභිනව ගුප්ත ආචාර්‍යයන්ගේ 'අභිනය භාරතී' ග්‍රන්ථයෙනි.
3. අභිනව ගුප්ත 'නාට්‍ය ශාස්ත්‍රය' ග්‍රන්ථයෙනි.
4. සාරංගදේව පඬිතුමාගේ 'සංගීත රත්නාකරය' ග්‍රන්ථයෙනි.
5. නන්දිකේශ්වරගේ 'අභිනය දර්පනය' ග්‍රන්ථයෙනි. (.....)

11. 'පාලමොට්ටායි' සෙල්ලිපියෙන් විස්තර වන්නේ,
1. නිළියන් හා නළුවන් පිළිබඳවය. 2. දේවදාසින් හත්දෙනෙකු පිලිබඳව ය.
3. භ්‍රමණය වන නළඟනක පිළිබඳවය. 4. හින්දු බාලිකාවන් 500 ක් පිළිබඳව ය.
5. නටන ස්ත්‍රීන් හා පුරුෂයන් පිළිබඳවය. (.....)

12. දෙවන පරාක්‍රමබාහු රජු විසින් රචනා කළ මහා කාව්‍යයකි.
1. කඳවුරුසිරිත 2. රසවාහිනිය 3. සද්ධර්මරත්නාවලිය
4. එළු අත්තනගලුවංශය 5. කව්සිළුමිණ (.....)

13. රසභාව පිළිබඳ අදහස් දැක්වූ අපරදිග මතවාදීන් ලෙස දැක්විය හැක්කේ,
1. භරතමුණි සහ නන්දිකේශ්වර ය. 2. භරතමුණි සහ ඇරිස්ටෝටල් ය.
3. නන්දිකේශ්වර සහ ප්ලේටෝ ය. 4. ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් ය.
5. අරිස්ටෝටල් සහ සොක්‍රටීස් ය. (.....)

14. 'තාලය' මැනීම සඳහා යොදා ගන්නා කුඩාම මිනුම් ඒකකය වන්නේ,
1. තිත 2. ලය 3. මාත්‍රා 4. ග්‍රහ 5. යතිය (.....)

15. 'ගත් ජිංතත් ජිංතක තරිකිට ගජිත් කුදක් ජිකු තක තරිකිට' මෙම කස්තිරම නර්තනය කළහැකි තාල රූපය වන්නේ,
1. මැඳුම් මහ දෙතිත ය. 2. තුන්සුළු මහ සිව් තිතය.
3. දෙසුළු මහ තුන්තය. 4. තුන්සුළු දෙමහ පස්තිතය.
5. සුළු මහ දෙතිතය. (.....)

16. 'බණ්ඩිබෙරය, පොකුරු බෙරය සහ දෑත සරි බෙරය ආදී නම් වලින් හඳුන්වන බෙර වර්ග පිළිවෙලින්,
1. තම්මැට්ටම, දවුල සහ දෙවොල් බෙරය 2. ගැටබෙරය, තම්මැට්ටම සහ දොවොල් බෙරය
3. තම්මැට්ටම, දොවොල් බෙරය සහ දවුල 4. ගැටබෙරය, තම්මැට්ටම සහ දවුල
5. ගැටබෙරය, දොවොල් බෙරය සහ දවුල (.....)

17. කොහොඹායක් කංකාරිය ශාන්තිකර්මයෙහි සියළුම යක්දෙස්සන් සහ බෙර වාදකයින් සහභාගි වන ප්‍රථම නර්තන අංගය වන්නේ,
1. ආවැන්දුමය. 2. කුවේණි අස්නෙය. 3. හත්පදයය. 4. මඩුපුරයය. 5. යක්කැනුමය. (.....)

18. 'තක්කඩ කඩතක ජිජිකුද ජිත්කඩ කඩතක ජිජිකුද'' මෙම කස්තිරම අන්තර්ගත වන්නේ,
1. පැනීම් සරඹයේය. 2. බඹර සරඹයේය. 3. චන්ද්‍රිකා සරඹයේය.
4. දෑත පෑගීමේ සරඹයේය. 5. අංගහාරය සරඹයේය. (.....)

19. අපරදිග බැලේ කෘතිවල බහුලව දක්නට ලැබෙනුයේ,
1. ප්‍රකාශානාත්මක චලනයන්ය. 2. රිද්මයානුකූල චලනයන්ය. 3. අභිචලනයන්
4. සංචාරි චලනයන්ය. 5. තාලානුකූල චලනයන් ය. (.....)

20. ගීත නාට්‍ය හා ශෛලිගත නාට්‍ය සඳහා උදාහරණ ලෙස දැක්විය හැක්කේ,
1. දෙපානෝ සහ කැලෑමල් ය. 2. කැලෑමල් සහ පේමතෝ ජායතී සෝකෝ ය.
3. සිංහබහු සහ මනමේ ය. 4. පේමතෝ ජායතී සොකෝ සහ සිංහබාහු ය.
5. මනමේ සහ ලෝමහංස ය. (.....)

21. 'මල්මාලා සොඳ වරම් ලැබෙනවා' ..... මෙම කවියෙන් කියැවෙනුයේ,
1. කළගෙඩි නැටුමට සැරසෙන ළඳුන් පිළිබඳව ය.
2. කුළු නැටුමට සැරසෙන ළඳුන් පිළිබඳවය.
3. මෝල්ගස් නැටුමට සැරසෙන ළඳුන් පිළිබඳව ය.
4. කොහොඹ කළේ නැටුමට සැරසෙන ළඳුන් පිළිබඳව ය.
5. තේ දළු නැටුමට සැරසෙන ළඳුන් පිළිබඳව ය. (.....)

22. උඩරට, පහතරට සහ සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග පිළිවෙළින්,
1. තෙල්මෙ, ශුද්ධ මාත්‍රය සහ මුල් මාත්‍රය වේ. 2. මංගලම්, මුල් මාත්‍රය සහ ශුද්ධ මාත්‍රාය වේ.
3. මුල් මාත්‍රය, මංගලම් සහ ශුද්ධ මාත්‍රය වේ. 4. ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය, සහ යක්කැනුම වේ.
5. මංගලම් ශුද්ධ මාත්‍රය සහ මුල් මාත්‍රය වේ. (.....)

23. 'තාක්කු තක ජිජි කුද - දොහොකඩ තහකඩ තක ජිජි කුද'' මෙම අඩව්ව අන්තර්ගත වට්ටම හා තාල රූපය වන්නේ,
1. දොංජිංත ගත දොංත වට්ටම හා සුළු මහ දෙතිත
2. දොංජිංත ගත දොංත වට්ටම හා මැදුම් තනිතිත
3. දොංජිංත ගත දොංත වට්ටම හා සුළු මැදුම් දෙතිත
4. කුද ගජිගත වට්ටම හා මැදුම් තනිතිත
5. කුදාංත ගත දොං වට්ටම හා දෙසුළු මහ තුන්තිත (.....)

24. සිංහල ජන ජීවිතය හා බැඳුනු ගායනා අතර ගද්‍ය හා පද්‍ය කොටස් දෙකින් ප්‍රබන්ධ වී ඇති සුවිශේෂී ගායනා වර්ගයකි.
1. ටීකා සිවු පද 2. බඹර කවි 3. නෙළුම් කවි 4. පතල් කවි 5. ප්‍රශස්ති
(.....)

25.



A



B



C

ඉහත A B හා C රූපසටහන් වලට අදාල ඇඳුම් කට්ටල භාවිතා කරන ශාන්තිකර්ම පිළිවෙලින්,
1. කොහොඹායක් කංකාරිය, කිරිමඩුව හා වළියක් මංගලය
2. දොවොල් මඩුව, පහන් මඩුව හා කොහොඹායක් කංකාරිය
3. දොවොල් මඩුව, පහන් මඩුව හා රටයකුම
4. කොහොඹායක් කංකාරිය, දොවොල් මඩුව හා පහන් මඩුව
5. කිරිමඩුව, වළියක් මංගල්‍ය හා දෙවොල් මඩුව (.....)

❖ **26 - 30 තෙක් හිස්තැන් වලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. කොහොඹායක් කංකාරිය ශාන්තිකර්යේ කුවේණි අස්න නර්තනයේ දී ........................................................ විසින් රැගෙන යන පන්දම අත් පන්දම ලෙස හැඳින්වේ.

27. ස්ථායි භාව අවධි කිරීමට ................................ මුල් වේ.

28. ආතත, විතත, විතතාත, ඝණ ශුසිර යනුවෙන් ලංකාවේ සංගීත භාණ්ඩ ප්‍රථම වර්ගීකරණය පිළිබඳ තොරතුරු හෙළිවන්නේ මහා වංශයෙන් .................................. ටීකාවෙනි.

29. මහා පරාක්‍රමබහා රජතුමා නැටුම්, ගැයුම්, වැයුම් පැවැත්වීම සඳහා සරස්වතී මණ්ඩපය ඉදිකළ බව ..................................... සඳහන් වේ.

30. උඩැක්කි වරපට සඳහා ............................................. යොදාගනී.

31. සූවිසි විවරණ, සත්සතිය ආදී ආගමික උත්සව අවස්ථා වලදී .................................... නැටුම යොදාගනී.

32. 'සිංහල තිත් තාල ක්‍රමය' .......................................... මහතාගේ කෘතියකි.

33. 'ගුරු අක්ෂරයක් මුලට යෙදී 'හල් අක්‍ෂරයක් මිශ්‍රව පද ගොඩ නැගෙන අවස්ථා .................................. ලෙස හඳුන්වයි.

34. තාලය තැබීමට පෙර ගායනය ආරම්භ කිරීම ......................................... නම් වේ.

35. තම්මැට්ටම් වාදනයට හුරුවීම සඳහා භාවිතා කරන උපකරණය ............................................. නමින් හඳුන්වයි.

❖ **36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ කෙටි පිළිතුරු සපයන්න.**

36. සුගත් දහම් සඟ රත්නෙ වැඳිල්ලා - රැගත් සුරන් සැම දෙවි ඇදහිල්ලා ... මෙම ගායන වර්ගය සහ තාල රූපය නම් කරන්න.
 I. ගායනය - ..................................................................................
 II. තාලරූපය - ..................................................................................

37. නානුමුරය අන්තර්ගත නර්තන සම්ප්‍රදාය හා ශාන්ති කර්මය ලියන්න.
 I. සම්ප්‍රදාය - ..................................................................................
 II. ශාන්තිකර්මය - ..................................................................................

38. නෘත, නෘත්‍ය හා නාට්‍ය වශයෙන් තුන් ආකාරයක රැඟුම් විශේෂ පිළිබඳ මනාව විග්‍රහ කර ඇති ග්‍රන්ථය හා එය රචිත සියවස නම් කරන්න.
 I. ග්‍රන්ථය - ..................................................................................
 II. සියවස - ..................................................................................

39. 'පාත කැළණිපුර ලක්දිව භාරව සිටගෙන' යන කවි පදය මාත්‍රා 3 + 3 තාල රූපයට ගැයීමේදී එහි සැදැස්මස් හා ගීමත් ගණන සඳහන් කරන්න.
 I. සදැස්මස් ගණන - ..................................................................................
 II. ගීමත් ගණන - ..................................................................................

40. සතර බීජාක්ෂර ගැටබෙරයෙන් වැයීමේදී වම්බෙර ඇසින් හා දකුණු බෙර ඇසින් වැයෙන අක්ෂර වෙන වෙනම සඳහන් කරන්න.
 I. වම් බෙර ඇස - ..................................................................................
 II. දකුණු බෙර ඇස - ..................................................................................

41. 'හීනාන්ත' සහ 'ක්‍ෂණාන්ත' යන්නෙහි තාල සංකේත දක්වන්න.
 I. හීනාන්ත - ..................................................................................
 II. ක්‍ෂණාත්ත - ..................................................................................

42. 'සොපින සොමි වන කැළුම්' යන කවි පදය අන්තර්ගත නර්තන අංගය සහ එය අයත් ශාන්තිකර්මය නම් කරන්න.

I. නර්තන අංගය - ..................................................................................

II. ශාන්ති කර්මය - ..................................................................................

43. තාලය සහිත සහ තාලය රහිත බව කවිපද ගායනයේදී හඳුන්වන නාම ලියා දක්වන්න.

I. තාලය සහිත - ..................................................................................

II. තාලය රහිත - ..................................................................................

44. පොලොන්නරු යුගයේ නවග්‍රහ බලි ශාන්තිකර්මය පැවැත්වීමට හේතු වූ රජතුමා හා ඒ පිළිබඳ සඳහන් වන වංශකතාව ලියන්න.

I. රජතුමා - ..................................................................................

II. වංශකතාව - ..................................................................................

45. ශාන්ති කර්ම ක්ෂේත්‍රය බිහිවීමට ප්‍රධාන වශයෙන් ඇදහිලි තුන් වර්ගයක් බලපා ඇත. දේව සංකල්පය ඉන් එකක් වන අතර අනෙක් දෙවර්ගය සඳහන් කරන්න.

I. ........................................................................ II. ........................................................................

46. සාම්ප්‍රදායක තිත් ක්‍රමයේදී සුළු තනිතිත අඩතිත ලෙස හැඳින්වූ අතර මැදුම් සහ මහ තනිතිත හඳුන්වන නාමය ලියන්න.

I. මැදුම් තනිතිත - ..............................................

II. මහ තනිතිත - ..............................................

47. කොහොඹායක් කංකාරියේ පුරාවෘත කථාව හා සම්බන්ධව ගායනා සමඟ ගොඩනැගී ඇති නර්තන අංග දෙක නම් කරන්න.

I. ........................................................................ II. ........................................................................

48. පහතරට නර්තන සම්ප්‍රදායෙහි දක්නට ලැබෙන කැරකීමේ ශිල්පක්‍රම දෙකකි.

I. ........................................................................ II. ........................................................................

49. ද්‍රවිඩ ගැමි නැටුම් වලදී භාවිතා කරන තාල වාද්‍ය භාණ්ඩය සහ ශුසිර වාද්‍ය භාණ්ඩය නම් කරන්න.

I. තාල වාද්‍ය භාණ්ඩය .................................................. II. ශුෂිර වාද්‍ය භාණ්ඩය ..................................................

50.



A



B

ඉහත A සහ B රූප වලින් දැක්වෙන භාව නම් කරන්න.

I. A .................................................. II. B ..................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 52 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .................................. නර්තනය (දේශීය) II කාලය පැය තුනයි

වැදගත්

I වන කොටසෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. II, III, කොටස්වලින් එක් ප්‍රශ්නය බැගින් ඇතුලත් වනසේ ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගින් ලැබේ.

## I කොටස

01. (i) කුවේණි අස්නෙ නර්තන අංගයේ පළමු මාත්‍රයට අයත් බෙර පදය දෙසුළු මහ තුන් තිතට ප්‍රස්තාර කරන්න.
'ලත් තැනින් කියත් මහසෙන් රට ගන්ටා - දෙමළු මත් වෙලත් දොඩත් වෙරිමන පෙන්වන්ටා'
(ii) මංගලම් නතර්තන අංගයට අයත් කස්තිරම ප්‍රස්තාර කරන්න.

02. දේශීය නර්තන කලාව විකාශනය වීමේදී ඓතිහාසික තොරතුරු මෙන්ම විවිධ වූ සංස්කෘතික ලක්ෂණ ද බලපෑ බව මූලාශ්‍ර මගින් අනාරණය වේ.
(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති ආකාරය මහා වංශය හා සෙල්ලිපි ඇසුරෙන් සාදක දෙකක් ඉදිරිපත් කරන්න.
(ii) දඹදෙණි හා කුරුණෑගල යුගවලදී තූර්ය භාණ්ඩ භාවිතා කළ ආකාරය සාහිත්‍ය කෘති දෙකක් පැහැදිලි කරන්න.
(iii) භාරතීය සංස්කෘතික ලක්ෂණ දේශීය නර්තනයට බලපෑ ආකාරය පොළොන්නරු යුගයේ පුරාවිද්‍යාත්මක හා ලිඛිත මූලාශ්‍රයක් ඇසුරෙන් විස්තර කරන්න.

## II කොටස

03. දේශීය නර්තන සම්ප්‍රදායන් වලට අයත් ශාන්තිකර්ම සුවිශේෂි අනන්‍යතා ලක්ෂණ වලින් සමන්විත වේ.
(i) කිරිමඩුව ශාන්තිකර්මයේ ආරම්භය හා සබැදි පසුබිම විස්තර කරන්න.
(ii) වළියක් මංගල්‍ය ශාන්ති කර්මයේ චාරිත්‍ර විධි පිළිබඳ හැඳින්වීමක් කරන්න.
(iii) සමාජ සහජීවනය වර්ධනයෙහිලා කිරිමඩුව ශාන්තිකර්මයෙන් ලැබෙන පිටුබලය අගයන්න.

04. ශාන්තිකර්ම වල ගායනය වාදනය පමණක් නොව එහි සැරසිලි මෙන්ම රංග වස්ත්‍රාභරණ ද විවිධ වේ.
(i) කිරිමඩුව ශාන්තිකර්මයේ රංග සැරසිලි දෙකක් හඳුන්වන්න.
(ii) කිරිමඩුව ශාන්තිකර්මයේ ආසාතාත්මක හා අනාසාත්මක ගායනා වලින් සමන්විතය. විමසන්න.
(iii) වළියක් මංගල්‍යයේ දී භාවිත රංග වස්ත්‍රාභරණ සහ සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න.

05. ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්‍ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනා වලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිඹිබු වේ.

(i) ගැමි නැටුමට ආවේනික සුවිශේෂ ලක්‍ෂණ තුනක් හඳුන්වන්න.

(ii) ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා නිර්මාණය වී ඇත. ගැමි නැටුම් වලට අදාල ගායනා දෙකක් මගින් පැහැදිලි කරන්න.

(iii) ජීවන වෘත්තීන් පදනම් කරගෙන නිර්මාණය වූ සිංහල මෙන්ම ද්‍රවිඩ ගැමි නැටුම් දැකිය හැකිය. නිදසුන් සහිතව විග්‍රහ කරන්න.

## III කොටස

06. නර්තනය හා නාට්‍ය ශෛලීන් අතර ඇති සහ සම්බන්ධතාවය සුවිශේෂී වේ.

(i) නාට්‍යධර්මී සහ ලෝකධර්මී නාට්‍ය යන්න අර්ථ දක්වන්න.

(ii) ගීත නාට්‍ය වල නර්තනය යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.

(iii) දේශීය ගැමි නාටක වල නර්තන භාවිතය කර ඇති ආකාරය විමසුමකට ලක් කරන්න.

07. රසභාව සංකල්පය හඳුන්වාදීමේදී විවිධ අවස්ථා අනුව මිනිසා තුළ ඇතිවන හැඟීම් ද විවිධය.

(i) නව නළු රසය හා ඒ සම්බන්ධ භාවය නම් කරන්න.

(ii) රස නිෂ්පත්තියට බලපාන සාධක හඳුන්වන්න.

(iii) දේශීය ශාන්තිකර්ම වල රසභාව දැකිය හැකි අවස්ථා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

08. (i) දේශීය නර්තන සම්ප්‍රදායන් වලට අයත් රංග ආභරණ දෙක බැගින් නම් කරන්න.

(ii) රංග ආභරණයක් නිර්මාණය කිරීමට පෙර නිරීක්‍ෂණය කළ යුතු අවස්ථා හඳුන්වන්න.

(iii) රංග ආභරණ නිර්මාණය කිරීමට භාවිත කරන අමුද්‍රව්‍ය හා නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
දෙවන වාර පරීක්ෂණය - 2020

**12 ශ්‍රේණිය** | **නර්තනය I** | **පිළිතුරු පත්‍රය**

**<u>I කොටස</u>**

| | | |
|---|---|---|
| **01.** - 5 | **11.** - 2 | **21.** - 2 |
| **02.** - 2 | **12.** - 5 | **22.** - 5 |
| **03.** - 1 | **13.** - 5 | **23.** - 3 |
| **04.** - 4 | **14.** - 3 | **24.** - 1 |
| **05.** - 3 | **15.** - 4 | **25.** - 4 |
| **06.** - 2 | **16.** - 2 | |
| **07.** - 5 | **17.** - 5 | |
| **08.** - 1 | **18.** - 1 | |
| **09.** - 3 | **19.** - 3 | |
| **10.** - 4 | **20.** - 4 | |

26. අතෝරකරු 27. විභාව 28. වංසත්තප්ප, කාසිනිය
29. චූලවංශය 30. නියඳකෙදි 31. පන්තේරු 32. සරත් විජේවර්ධන
33. හලන්තගුරු
34. විෂමග්‍රහ 35. කොට්ටබිස්ස
36. I පන්තේරු II මහ තනි තිත 37. I. පහතරට II. රටයකුම
38. I නාට්‍ය ශාස්ත්‍රය II. ක්‍රි.පූ. 3 වන සියවස
39. I . සදැස්මස් 20 II. ගීමත් 24
40. I. වම - තත්, තොං II. දකුණ - ජිත්, නං
41. I. /\ II. /
42. I. කුවේණි අස්න II. කොහොඹාංකාරිය
43. I. ආඝාත්තමක II. අනාඝාත්තමක 44. I. නිශ්ශංකමල්ල රජ II. චූල වංශය
45. I. ග්‍රහ II. යක්ෂ 46. I. මධ්‍ය II. තාල
47. I. කුවේණි අස්න II. කොහොඹා හැල්ල
48. I. මාලක්කම II. බඹර වළල්ල
49. I. තවිල් බෙරය II. නාදස්වරම් 50. I. රසය :- ජුගුප්සා භාවයඃ- විශ්මය

**<u>II පත්‍රය - I කොටස</u>**

(1)

I

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | + | + | + | ත | කුඳ | - | ත | කුඳ | - | කුඳ | - | කු | ඳි | ග | ත |
| කු | කු | ත | ක | ජිඟ | + | + | + | + | + | තත් | - | ජිඟ | - | ත | ත |
| ජි | ජි | කු | ද | ග | ජිඟ | - | ගත් | තරි | කිට | කුඳ | දිත් | | | | |

සංකේත භාවිතයට ලකුණු - 02
නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු - 04
(ලකුණු - 06)

II

| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ලත් | - | තැ | නින් | - | කි | යත් | - | ම | හ | සෙන් | - |
| ර | ට | - | ගුන් | - | - | ටා | - | - | දෙ | ම | ළ |
| මත් | - | වෙ | ලත් | - | දො | ඩත් | - | වෙ | රි | ම | ත |
| ලෙන් | - | - | වන් | - | - | ටා | - | - | - | - | - |

සංකේත භාවිතයට ලකුණු - 02
කවි පද නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු-04
(ලකුණු - 06)

III

ගුරු අත්පොතට අනුව

| 1 | 2 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | දත් | - | ජිංකු | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ද | කු | ද | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | දත් | - | ජිංකු | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ද | කු | ද | තා | - | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | දත් | - | ජිංකු | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ජිත් | - | කු | දත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ගත් | - | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ත | ක | ජිත් | - | තත් | - | ජිං | - | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | කු | දත් | - | ජි | කු | ත | ක | ත | රි | කි | ට |
| ග | ත | කු | ද | කු | ද | තත් | ජිත් | තොං | නං | තා | | | |

සංකේත භාවිතයට ලකුණු - 02

කාලනිරම නිවැරදිව ප්‍රස්තාර කිරීමට - ලකුණු - 06

ලකුණු - 08

[මුළු ලකුණු - 20]

**II - පත්‍රය සඳහා පිළිතුරු**

02. (i) **මහා වංශය**

දුටුගැමුණු රජු රුවන්වැලි මහා සෑයේ ධාතු නිධානෝත්සවයට දහසය දහසක් නළගණන් පිරිවරාගෙන මහ පෙරහැරින් තූර්ය නාදය හා බෙර වයමින් ගිය වග

**මහාවංශය**

භාතිකාභය රජු සමයේ ඒ මිහිපති තෙමේ වසරක් පාසා අඛණ්ඩව මහබෝධිය බෝධි ස්නාන පූජා මහා චෛත්‍යයේ විවිධාකාර වූ නෘත්‍යාකාරයන් විසින් කරන ලද නැටුම් හා නානා ප්‍රකාර පසඟතුරු ගොස යන පූජාවර්ග පැවැත්වූ වග.

සැස්සේරුව, කොරවක්ගල සෙල්ලිපි වල සඳහන් නළුවන්ගේ හා නළුවන්ගේ දියණිවරුන් පිළිබඳ තොරතුරු

2 x 3 = 6

(ii) දඹදෙණි යුගයේ දඹදෙනි අස්න, කඳවුරු සිරිත, සද්ධර්මරත්නාවලිය යන කෘතිවල සඳහන් වන වාද්‍ය භාණ්ඩ භාවිතය පිළිබඳව සාදක වශයෙන් ලියා තිබීම.

කුරුණෑගල යුගයේ දළදා සිරිතෙහි හෝ වෙනත් සාහිත්‍ය කෘතියක සඳහන් තූර්ය භාණ්ඩ භාවිතය පිළිබඳව උදාහරණ සහිතව ලියා තිබීම. (ලකුණු 6)

(iii) 12 වන ශත වර්ෂයට අයත් පරාක්‍රමබාහු කුමාරයා උපන් ස්ථානය ලෙස සැලකෙන දැදිගම සූතිඝර චෛත්‍යයෙන් හෙවත් කොට වෙහෙරෙන් සොයාගත් ඇත් පහනෙහි බෙරකරුවකුගේ, තාලම්පට වාදකයෙකුගේ හා නර්තන ශිල්පියෙකුගේ රූප දක්නට ඇති බව ලියා තිබීම. (පුරාවිද්‍යාත්මක සාදක) හා

ආදල ලිඛිත සාධයක් ලියා තිබීම සඳහා (ල. 06)

03. (i) දේශීය නර්තන සම්ප්‍රදායන්වලට අයත් ශාන්තිකර්ම සුවිශේෂි අනන්‍යතා ලක්ෂණවලින් සමන්විත වේ. (ල. 06)

කිරිමඩු ශාන්ති කර්මයේ ආරම්භය හා සබැඳි පසුබිම විස්තර කරන්න.

සබරගමු ප්‍රදේශයේ ශාන්තිකර්මය අතර ගවපට්ටි සංවර්ධනය හා ආරක්ෂාව උදෙසා පවත්වනු ලබන ශාන්තිකර්මයෙක් බව

ගව පට්ටිවල ඇතිවන්නාවූ රෝග පීඩාදියෙන් මුදවා ගැනීම උදෙසා පවත්වන බව

මංගර දෙවියන් ප්‍රධානකොට පුද පූජා පැවැත්වීමෙන් ගව සම්පත ආරක්ෂා වන බව

ගවයා කෘෂිකාර්මික ජන ජීවිතයට නැතිවම බැරි සත්ත්වයෙක් බව

මංගර දෙවියන්ට අමතරව පත්තිනි දේවිය ප්‍රධානත්වයෙලා විෂ්ණු, කතරගම, දැඩිමුණ්ඩ ආදි ගොපලු කුරුමීබර සමඟ

දොළොස් කුරුම්බරයන්ට පුදපෙත් දෙනු ලබන බව. (ලකුණු 6)

(ii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ චාරිත්‍ර විධි පිළිබඳ හැඳින්වීමක් කරන්න.
තේවා වාදනය සමඟ පූජා චාරිත්‍ර විධි ආරම්භ කරන බව
පළමු දිනයේ සිට සත්වන දිනය දක්වා නියමිත වේලාවන් අනුව තේවා හේවිසි වාදනයෙන් ආරම්භ කරන බව
සත්වන දින පූජා චාරිත්‍ර ආරම්භ කළ යුත්තේ මාළිගයේ දහවල් පෙරහැර ගෙවදින වෙලාවකට බව.
කොහොඹායක් කංකාරියේ නාට්‍යමය ලක්ෂණ වන වැදියක්කම, නයායක්කම මහායක්කම, පෙළපාලියේහිදී රඟ දක්වන බව
කාලියාම, ගරායකුන් නැටීම,
ආවනැදුම, දොඟර ජිං ගජිං වට්ටම නැටීම කීලබැඳීම.
යන චාරිත්‍ර සිදුකරන බව චාරිත්‍ර විධි 03 ක් වත් ලියා ඇත්නම් (ල. 06)

(iii) සමාජ සහජීවනහෙලා කිරිමඩුව ශාන්තිකර්මයෙන් ලැබෙන පිටුබලය අගය කරන්න.
සාමුහිකත්වයෙන් සහ සහයෝගයෙන් යුතුව වාදභේද දුරලා ගමේ පොදු යහපත උදෙසා එක්සත්ව කටයුතු කිරීම කැපී පෙනෙන ලක්ෂණයක් බව.
මෙහි මූලිකත්වය ලැබෙන්නේ මංගර දෙවියන්ගේ උත්පත්තියට සම්බන්ධ කිරි ඉතිරිවීම බව
කිරි ඉතිරිවීමෙන් සෞභාග්‍ය අපේක්ෂා කරන බව
කිරි ඉසීමෙන් ගවපට්ටි ආරක්ෂා කරන බව
කහ රොටී දානය සියලු දෙනා වෙත පිළිගැන්වීමෙන් සාමුහිකත්වය සහයෝගය සමගිය වෙනුවෙන් උස්පහත් භේදයකින් තොරව සමසේ සලකන බව යනාදි කරුණු 04 ක් විස්තර කිරීමට
(මුළු ලකුණු 20)

04. (i) ශාන්තිකර්මවල ගායනය, වාදනය, පමණක් නොව එහි සැරසිලි මෙන්ම රංග වස්ත්‍රාභරණ ද විවිධ වේ.
කිරිමඩුව ශාන්තිකර්මයේ රංග සැරසිලි දෙකක් හඳුන්වන්න.
කිරිමඩු ශාන්තිකර්මයේ දී ප්‍රධාන රංග භූමිය සීමා පනවා වෙන්කර ඇති අතර රංග සැරසිලි අටකින් සමන්විත බව.
මල්යහනාව, කිරිවැස්ස ප්‍රධාන සැරසිලි දෙකබව
මල්යහනාව ලියවැලින් හා මල්පෙතිවලින් අලංකාර කරන බව.
කිරිමඩුවේ ප්‍රධාන පරමාර්ථය කිරි උතුරවා සෙත් ශාන්තිකොට සෞභාග්‍ය ලබාදීම වන අතර ඒ සඳහා තැනෙන සැරසිල්ල කිරිමැස්ස බව.
ජේකඩ සහිතව සකස් කර ගන්නා මැස්ස කෙසෙල් පතුරුවලින් අලංකාරව කරගන්නා බව
රංග සැරසිලි නම් කිරීමට (ල. 02) විස්තර කිරීමට (ල.04) මුළු ලකුණු (06)

(ii) කිරිමඩුව ශාන්තිකර්මය ආශාත්මක හා අනාශාතාත්මක ගායනාවලින් සමන්විතය. විමසන්න.
නමස්කාර කවි, මල්යහන් කවි, හත්පද පෙළපාලියට අයත් කවි, නානුමුර කවි, මංගර සැහැල්ල සහ කිරි ඉතිරවීමේ කවි ලෙස හඳුන්වා තිබීම.
ඒ ඒ ගායනාවලට අදාල කවි දෙකක් ලියා තිබිය කිරි ඉතිරිවීමේ කවියක්

බෝකොට මඩුවක් බිම ජේකරතී
දෙවියන් යැදලා අවසර අරගතී
වරම් ලබා අවසර ඉල්ලාගතී
කිරි උතුරන්නට මාන බලායතී

මල්යහන් කවියක්

මුනිමුතුන් අණැදැරු - දෙවි බඹුන් සැම ගුරුවරු
ලැබූ වරම් ඉසුරු - මල්යහන් කවි කියම් විසිතුරු
කිහිරැලි උපුල්වන් - සමන් බෝක්සැල් දෙවියන්
පිතිනි කඳකුමරුන් - අදත් මේ සැම දෝස දුරලන (ලකුණු 6)

(iii) වලියක් මංගල්‍යයේදී භාවිතා රංග වස්ත්‍රාභරණ සහ සැරසිලි පිළිබඳ විමසීමක් කරන්න.
වලියක් මංගල්‍යයේ යක්දෙස්සන්ගේ රංග වස්ත්‍රාභරණය වෙස් ඇඳුම් කට්ටලය බව.
හිසට වෙස් තට්ටුව වෙනුවට සිවිලිය හිස් පළඳනාව පළඳින බව
සිවිලිය සිබාබන්ධනය මෙන් දෙගුණයකින් යුක්ත බව
සිරස වටාම පළඳිනු ලබන්නක් බව
මලට රජුගේ ඔටුන්න සිවිලිය බව
වර්තමාන සිවිලිය කුඩා ආභරණයක් බව
සැරසිලි
සොලොස් මඟල නම් වූ සැරසිල්ල විශේෂ තැනක් ගන්නා බව
මෙම සැරසිල්ල සඳහා කැකුලු හාල් සේරු දහසක් බුලත්, මැටිපහන්, පොල්ගෙඩි, තිර පඩුරු දහසය බැගිනුත් ලෙල්ල සහිත පොල්ගෙඩි 04 ක් සුදුනූල ලී කෝටු හතරක් අවශ්‍ය බව.
ගවරමල සැරසිල්ල වලියක් උඩුවියන අතර බාල්කයෙහි එල්ලා ඇති ගොප්කොළ හා පොල්මල් සැරසිල්ලක් බව
මේ සැරසිල්ල සඳහා උණ ලී කැබලි භාවිතා කරනව බව
මෙහි ආකෘතිය පැරණි ග්‍රැමෆෝන් යන්ත්‍රයේ මලෙහි හැඩයට සමාන බව.
රංග වස්ත්‍රාභරණ හැඳීන්වීමට (ල. 04) සැරසිලි හැඳින්වීමට (ල.04) (මුළු ලකුණු 08)

05. (i) ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ මෙන්ම ඒ හා බැඳි ගායනාවලින් ඔවුන්ගේ ජීවන රටාව පිළිබිඹු වේ.
ගැමි නැටුමට ආවේණික සුවිශේෂ ලක්ෂණ 03 ක් හඳුන්වන්න.
සාමුහික නර්තනයේ යෙදීම. සරල බව හා එමකම උපකරණ භාවිතය
ජීවන වෘත්තීන් හා බැඳි රිද්ම රටාව පාදකවීම.
සුවිශේෂ ලක්ෂණ නම් කිරීමට (ල. 03) විස්තර කිරීමට (ල.03) (මුළු ලකුණු 06)

(ii) ගැමි ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා නිර්මාණය වී ඇත.
ගැමි නැටුම්වලට අදාල ගායනා දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.
ඇදහිලි හා විශ්වාස පිළිබඳ නිර්මාණය වී ඇති ගායනා ලෙස

ඉරදෙවියන්ගේ ඉරගල ගාවා වරම් වරම් ඉරසඳ දෙවි ඇතින් වරම්
මල්මාලා සොඳ වරම් ලබනවා ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ
බෝ අත්තට වැඳ සිරස නමන්නේ
යනාදි ගායනා දෙකක් ලියා ඇත්නම් (ල.02) පැහැදිලි කිරීමට (ල.04) (මුළු ලකුණු 6)

(iii) ජීවන වෘත්තීන් පදනම් කරගෙන නිර්මාණය වූ සිංහල මෙන්ම ද්‍රවිඩ ගැමි නැටුම් දැකිය හැකිය. නිදසුන් මගින් විග්‍රහ කරන්න.
වෘත්තීන් ඇසුරෙන් නිර්මාණය වූ ගැමිනැටුම් ලෙස ගොයම් කුළු, මෝල්ගස්, ලෙස හඳුන්වා ඇති බව.
ද්‍රවිඩ ගැමිනැටුම් ලෙස අරිවුවෙට්ටු, සුලකු, කොළදු පටිනාල් හඳුන්වා ඇතිබව
සිංහල ගැමි නැටුම් සඳහා සරල බෙර පද, මාත්‍රා කවි යොදා නිර්මාණය වී ඇතිබව.
ද්‍රවිඩ ගැමිනැටුම් සංගීතයට කෙරෙන රංගගනයක් බව
නම්කරන ලද සිංහල හා ද්‍රවිඩ ගැමිනැටුම්වලට අදාල ක්‍රියාකාරකම් හඳුන්වා ඇතිබව
රංගවස්ත්‍රාභරණ හා නර්තන නිර්මාණ පිළිබඳ හඳුන්වා තිබීම.
ගැමි නැටුම නම් කිරීමට (ල.04) විස්තර කිරීමට (ල. 04) මුළු (ල. 08)

06. (i) නාට්‍ය ධර්මී හා ලෝක ධර්මී නාට්‍ය යන්න අර්ථ දක්වන්න.
ලෝක ධර්මී නාට්‍ය ස්වභාවික නාට්‍ය සම්ප්‍රදාය ලෙස හඳුන්වන බව.
යාම්ර්ම්, කතාබහ, ඉරියව්, සංවාද, රංග වස්ත්‍රාභරණ, රංග බාණ්ඩ, වේෂ නිරූපණය, අංග රචනය ආදිය යොදා ගනු ලබන්නේ සැබෑ ජීවිතයේ සිද්ධිවලට ගැලපෙන ආකාරයෙන් බව
රංග භූමිය, ආලෝකකරණය, සංගීතය ආදියද තත්වානුකූල බවින් යුක්ත බව
නාට්‍ය ධර්මී නාට්‍ය යනු සංවාද දෙබස්, ගීත එක්තරා රිද්මයක් අනුව යොදා අභින හා සංකේත මගින් නිරූපණය කරන බව
වෙස් මෝස්තර, ගමන්තාල, රංග භාණ්ඩ, ආදිය ඊට ගැලපෙන ආකාරයට යොදාගන්නා බව
ස්වාභාවික බවෙන් ඈත්වූ එක්තරා ශෛලියකට අනුව සෑම අංගයක්ම ඉදිරිපත් කරන බැවින් නාට්‍ය ධර්මී නාට්‍ය ලෙස හඳුන්වා තිබීම.
නාට්‍ය වර්ග දෙක හඳුන්වා තිබීම. (ලකුණු 6)

(ii) ගීත නාට්‍යවල නර්තන යොදා ඇති ආකාරය විමසුමට ලක් කරන්න.
දෙබස් උච්චාරණයකින් තොරව සම්පූර්ණයෙන්ම ගීත ගායනා මාධ්‍ය කොටගෙන නාට්‍ය අවස්ථා විකාශනය ගීත නාට්‍ය යනුවෙන් හඳුන්වන බව
ලංකාවේ නිෂ්පාදනය වූ ගීත නාට්‍ය ලෙස පේමනෝ ජායතී සෝකෝ, කැලෑමල් දෙපානෝ යන නාට්‍ය හඳුන්වන බව
එම ගීත නාට්‍යවල ගති ලක්ෂණ ප්‍රදර්ශනය කිරිමට උචිත අයුරින් නර්තන නිර්මාණය කර යොදාගන්නා බව
ඉහත කරුණු ඇසුරින් විස්තර කිරීමට (ලකුණු 6)

(iii) දේශීය ගැමි නාටකවල නර්තනය භාවිතා කර ඇති ආකාරය විමසුමට ලක් කරන්න.
දේශීය ගැමිනාටක ලෙස සොකරි කෝලම් නාටක නම් කිරිම.
කෝලම් නාටකය කවි, සංවාද සහ නර්තන අංගයන්ගෙන් සමන්විත වේ.
සරල පද, ගමන්තාල මෙන්ම සංකීර්ණ නර්තන පද කෝලම් නාටකය තුළ අන්තර්ගත වි ඇතිබව
එක් එක් චරිතය සඳහා සුවිශේෂි නර්තන පද භාවිතා කරන බව
ගතිගත ගුම් රිම්ගත ගතිතත ගතිත ගතම් මුදලිගේ චරිතයට භාවිතා කරන බව
නොංචි අක්කාගේ චරිතය - දොංත ගතම් දොංත ගතිගතම් තත් රෙගතම් තත් රෙගත ගතිගතම් යන පදවලින් සමන්විත බව.
සොකරි නාටකයේ ගුරුහාමි, පරයා, වෙදරාල සොකරි යන චරිත සඳහා මාත්‍රා තුනේ තාලයට දොං ජිජිගත සරල බෙර පද, කවි ගායනා නර්තන විධි ඉදිරිපත් කරන බව.
ගැමි නාටක නම් කිරිමට (ල. 02) එම නාටක විස්තර කිරීමට (ල.06) (මුළු ලකුණු 08)

07. (i) රසභාව සංකල්ප හඳුන්වා දීමේදී විවිධ අවස්ථා අනුව මිනිසා තුල ඇතිවන හැඟීම් විවිධවේ.
නව නළු රසය හා ඒ හා සම්බන්ධ භාවයන් නම් කරන්න.

| භාවය | රසය |
|---|---|
| රති | ශෘංගාර |
| හාස | හාස්‍ය |
| ශෝක | කරුණා |
| ක්‍රෝධ | රෞද්‍ර |
| උත්සාහය | වීර |
| භය | භයානක |
| ජුගුප්සා | බීභත්ස්‍ය |
| විශ්මය | අද්භූත |

නම් කිරිමට (ල. 06)

(ii) රස නිෂ්පත්තියට බලපාන සාදක හඳුන්වන්න.
කලා කෘතියක් නිර්මාණය කිරිමට විවිධ සාදක අවශ්‍ය බව
එම සාදක ලෙස විභාව, අනුභාව, ව්‍යාභිචාරිභාව යන කරුණුවල සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිදු වන බව
ඉහත සාදක වෙන වෙනම විස්තර කිරීම.
සාදක නම් කිරිමට (ල.03) විස්තර කිරිමට (ල.03) (මුළු ල. 06)

(iii) දේශීය ශාන්තිකර්මවල රසභාව දැකිය හැකි අවස්ථා උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.
ශාන්තිකර්මවල රසභාව දැකිය හැකි අවස්ථා සෑම ශාන්තිකර්මයකම සුළුවෙන් හෝ දක්නට හැකිබව
එවැනි අවස්ථා ලෙස
සන්නියකුම් යක් නැටුම්, පාලි නැටුම්, මරු සන්නිය, සන්නි 18
දොවොල් මඩු පහන්මඩු යාගවල දෙවොල් ගොඩ බැසීම අඹ විදමන
රටයකුමේ - දොළහ පෙළපාලිය
සූනියමේ - වඩිග පටුන යනාදිය දක්වා තිබීම.
අවස්ථා නම් කිරිමට (ල.04) විස්තර කිරිමට (ල.04) (මුළු ලකුණු 08)

08. (i) දේශිය නර්තන සම්ප්‍රදායන් වලට අයත් රංග ආභරණ දෙක බැගින් නම් කරන්න.
උඩරට වෙස් ඇඳුම් කට්ටලය කොටස් දෙකක්
පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලය කොටස් දෙකක්
සබරගමු පබළු ඇඳුම් කට්ටලය කොටස් දෙකක් (ල. 06)

(ii) රංග ආභරණයක් නිර්මාණය කිරිමට පෙර නිරීක්ෂණය කළයුතු අවස්ථා හඳුන්වන්න.
දේශීය නර්තන සම්ප්‍රදායවලට ආවේනික පරම්පාරික ඇඳුම් කට්ටල අදාල ආභරණ හඳුනා ගතයුතු බව.
විහාර දේවාල ආශ්‍රිත පවත්නා චිත්‍ර, කැටයම් කෙරෙහි අවධානය යොමුකළ යුතු බව.
පුරා විද්‍යාත්මක සාධකවල දක්නට ලැබෙන නර්තන රංග වස්ත්‍රාභරණ නිරීක්ෂණය කළ යුතු බව.
කරුණු 03 ක් විස්තර කිරිමට (ලකුණු 6)

(iii) රංග ආභරණයක් නිර්මාණය කිරිමට භාවිතා කරන අමුද්‍රව්‍ය හා නිර්මාණය කිරිමේ ශිල්ප ක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.
අමුද්‍රව්‍ය - කාඩ්බෝඩ්, ලී කුඩු පල්ප, කපුනූල් වර්ග, පුළුන්, කෘත්‍රිම රබර් විශේෂ, කම්බි, තීන්ත වර්ග, විවධ වර්ණවලින් යුතු කුඩු ආදිය භාවිතා කරන බව.
ශිල්පක්‍රම - රංග ආභරණයක් නිර්මාණය කිරීමේදී එය පළඳින ස්ථානය, හැඩය පිළිබඳ අවබෝධ කරගත යුතුබව.
නිවැරදි හැඩය අනුව කාඩ්බෝඩ් කපාගත යුතු බව.
කපාගත් හැඩය සම්ප්‍රදායට අනුව මෝස්තර යෙදිය යුතුබව.
අවශ්‍ය නම් ආභරණයේ මූලික රේඛා ආශ්‍රිතව කපුනූල් යොදා සෙසු කොටස් කැටයම් කරගත හැකිබව.
අමුද්‍රව්‍ය නම් කිරිමට (ල.04) ශිල්පක්‍රම විස්තර කිරීමට (ල. 04) (ලකුණු 8

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

# 071 777 4440